# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/38 - 2012 ඔක්තෝබර් මස 05 වැනි සිකුරාදා - 2012.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

### සිවිල් ගුවන් සේවා අධිකාරිය

### 196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම

විධිමත් අභ්‍යන්තර මගී ගුවන් ප්‍රවාහන සේවාවක් (Domestic Scheduled Operations) රට තුළ පවත්වාගෙන යාම සඳහා 1955 ගුවන් සංතරණ පනතේ කොන්දේසි වලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය/ගුවන් සමාගම් සහතිකය ලබා ගැනීම සඳහා බත්තරමුල්ල, කෙලින් වීදිය, අංක 34 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත හයිබ්‍රිඩ් ඒවියේෂන්ස්. කොම් (පුද්ගලික) සමාගම විසින් 2012 ජූලි මස 09 දාතමින් ඉල්ලුම් පත්‍රයක් 2012 ජූලි මස 11 වැනි දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පතට අනුව සීමාසහිත හයිබ්‍රිඩ් ඒවියේෂන්ස්. කොම් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

ජයන්ත මිහිර වික්‍රමාරච්චි මහතා.  
තෙන්කොට්ටි රුවන් සාන්ත ද සිල්වා කරුණාරත්න මහතා.

එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම කළමණාකාරීත්වය සඳහා කීර්ති දිසානායක මහතා හයිබ්‍රිඩ් ඒවියේෂන්ස්. කොම් (පුද්ගලික) සමාගම විසින් නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කොළඹ 02, හුණුපිටිය පාර, අංක 04, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනක, කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator certificate), ගුවන් සමාගම් බලපත්‍රය (Airline license) ඇතුලු අනෙකුත් අදාල අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම අදාල ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත ක්‍රියාමාර්ගයන් (International Standard and Recommended Practices) සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වූත් ආරක්ෂිත වූත් කාර්යක්ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල ඔක්තෝබර් 25 දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැක. එවැනි සංදේශනයන්හි අන්තර්ගත සියලු ප්‍රකාශන වල නිරවද්‍යතාව ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය.** එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාල සංදේශනයට අමුණා තිබිය යුතුය.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2012 ක් වූ ඔක්තෝබර් මස 03 වැනි දින,
අංක 04, හුණුපිටිය පාර,
කොළඹ 02,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ දී ය.

10-792

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.